12/04/2011 - ලංකාදීප

**ආහාර සුරක්ෂිතතාව අභියෝග ජය ගැනීම - මිලින්ද මොරගොඩ**

මහජනතාවට, තොරතුරු දැනගැනීමට අයිතියක් ඇති බව ඉන්දියානු රජය නීතියෙන් පිළිගත්තේය. රජයට බදු ගෙවන මහජනතාව, තමන්ගේ බදු මුදල් රජය වැය කරන අන්දම දැනගැනීමට අයිතියක් ඇති බව පිළිගැනීම ප්‍රජාතන්ත්‍රවාදී රටක් විශිෂ්ඨ ගුණාංගයකි. තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම මගින් රජය හා මහජනතාව අතර විශ්වාසය වැඩිවෙයි. විනිවිද දකින අන්දමට රාජ්‍ය පාලනය යුක්ති සහගත බව දියුණු සමාජයේ විශ්වාසයයි. ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කරන තවත් පියවරක් ඉදිරියට තබන ඉන්දියාව තම මහජනතාවට ආහාර ලබා ගැනීමට අයිතියක් ඇති බව නීතියෙන් පිළිගැනීමට යයි. එය අලුත් දර්ශනයකි.

ඕනෑම රටක ජීවත්වන වැසියන්ට මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට එකී රටවල ඇති ව්‍යවස්ථාපිත රාමුවෙන් වගකීමෙන් බැඳී සිටියි. එනමුත් නොයෙකුත් අර්බුද හා ආර්ථික ප්‍රශ්න හමුවේ සැබෑ සාධාරණත්වය ඉටු නොවන බව පැහැදිළිය. ඒ නිසා අසරණවන දුගී දුප්පතුන්ගේ ප්‍රමාණය අති විශාලය. ලෝක ජනගහනයෙන් සෑහෙන කොටසක් දිනකට ඇමරිකානු ඩොලරයක් උපයා ජීවත්වන බව අනාවරණය වෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තීරණයක් අනුව ලිබියාවට ඇමරිකානු ප්‍රහාර එල්ල වූ පළමු දිනයේ වෙඩි උණ්ඩ වලට පමණක් ඇමරිකානු ඩොලර් මිලියන එකසිය තිහක් වැය කර තිබේ. දින දෙකක ගුවන් ප්‍රහාර වලින් පමණක් මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකරන්නට හැකිය. ලෝකය ගෝලීයකරණය වී ඇති බව කියන නමුත් හා ගෝලීයකරණය හෙයින් විශ්ව ගම්මානයක් බිහිවන බව ඇත්තක් නමුත් මේ විශ්ව ගම්මානයේ ජීවත්වීමට ආහාර සපයා ගත නොහැකිව දිනකට සැලකිය යුතු තරම් පිරිසක් මියයති. එවැනි පසුබිමක ඉන්දියානු රජය මහජනතාවට ජීවත්වීමට ආහාර සපයා ගැනීමට අයිතියක් ඇති බව නීතියෙන් පිළිගැනීම විශේෂ අවධානයට ලක් විය යුතු කරුණකි.

ශ්‍රී ලංකාව මේ දිනවල සිංහල හා දෙමළ අළුත් අවුරුද්දට සූදානම් වෙයි. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණයවීම අවුරුද්දට නිමිත්ත වන නමුත් සැනසිල්ල හා සෞභාග්‍යය ගැන ගැඹුරු පණිවුඩයක් අවුරුද්ද හා බැඳී තිබේ. එය සෘජුවම ආහාර සමග සම්බන්ධය. පුරාණයේ පටන් අවුරුද්ද සමරන්නට සූදානම් වූයේ කලින් කන්නයේ අස්වැන්න නෙලා තම ගබඩාවල තැන්පත් කර ඉදිරි කන්නයේ වගා කටයුතු අවසන් වීම සමගය. බහුලව සිදු කරන්නේ වී වගාව හෙයින් කාලගුණ තත්ත්ව අනුව මෙම අවුරුදු උදාවන වකවානුව වන විට ගොවීහු කුඹුර අස්වද්දා කෙටි විවේක කාලය අවුරුදු සංක්‍රාන්තිය සමග සමරයි.

සිංහල හා හින්දු අවුරුදු උදාවෙ සංස්කෘතික අංග ස්වභාව ධර්මයට මුල් තැනක් දෙමින් සකස් වී තිබේ. ආහාර වතාවත එහි ප්‍රමුඛ ය. පුණ්‍ය කාලය තුළ ආහාර අනුභවය කිරීමෙන් වැළකෙයි. නැකතට ගිනි දල්වා කිරි බත් පිසෙයි. එය අනුභව කරන්නේ නැකැත් චාරිත්‍ර අනුවය. ආහාරය උතුම් කොට සලකයි. අග්‍ර කොටස බුදු රජානන්වහන්සේ වෙනුවෙන් පූජා කෙරෙති. මහා සංඝ රත්නයට පිරිනමති. නිවසේ ආහාර අනුභවයේ දී මුළින් එය පිරි නමන්නේ පවුලේ වැඩිහිටියන්ටය. අලුත් සහල, නැවුම් වළඳ, සහල් හා ධාන්‍ය උපයෝගී කරගෙන තනන රසකැවිළි අවුරුදු උදාව සමරන්නට සෑම නිවෙසකම තැනෙයි. මේ නිසා ශ්‍රී ලංකාවට ගොවිතැන, අස්වැන්න හා ආහාර සම්බන්ධයෙන් මහා සම්මතයක් තිබේ. මෙම සුබ අවස්ථාවේ දී ශ්‍රී ලාංකිකත්වය හා ආහාර සඳහා මහජනතාවට ඇති අයිතිය ගැන සාකච්ඡා කිරීම වැදගත්ය.

ඉන්දියාව ආහාර ලබා ගැනීම මහජනතාවට ඇති අයිතියක් බව තීරණය කළේ දැනට ලෝකය පුරා පැතිරෙන ආහාර අර්බුදය සමගය. කාලගුණ විපර්යාස හෙයින් ලෝකයේ වගා බිම් විශාල වශයෙන් විනාශ වී ඇත. ලෝක ආහාර නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අන්දමට පරිභෝජනය වැඩිවී තිබේ. චීනය, ඉන්දියාව හා අප්‍රිකාව වේගවත් සංවර්ධනයක් දක්වන

අතර මෙම සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් එකී රටවල මහජනතාවගේ ආදායම වැඩිවෙමින් පවතී. ඔවුහු කලින් ගතකළ ජීවිතයට වඩා එළවලු පළතුරු හා මාංශ නිෂ්පාදන මිළදී ගැනීම ලෝක නිෂ්පාදනයට ගැටලු සහගත තත්ත්වයක් ඇති කර තිබේ. එක පැත්තකින් නිෂ්පාදන අඩුවන විට තවත් පැත්තකින් පරිභෝජනය ඉහළ යාමේ දී හිඟයක් ඇති වන අතර ඒ නිසා ආහාර මිළ ඉහළ යයි. පසුගිය කාලය තුළ අප මුහුණ දුන්නේ එවැනි අවස්ථාවකටය. ශ්‍රී ලංකාවේ පැවති අයහපත් කාලගුණය හෙයින් වී හා එළවලු වගා අස්වැන්නෙන් සියයට විස්සක් පමණ හානි විය. කෙටි කාලීනව මෙය ප්‍රශ්නයකි. එළැඹෙන වගා කන්නයේ දී වැඩි පුර වගා කිරීමෙන් ප්‍රශ්නයට මුහුණ දෙන්නට හැකිය. එනමුත් රටතුළ ඇතිවන හිඟය පියවන්නට කෙටි කාලීනව අත්‍යවශ්‍ය ආහාර ආනයනය කිරීම ගැටලු සහගත වන්නට ඉඩ තිබේ. රුසියාවේ නියඟයකි. ඔස්ට්‍රේලියාව, පකිස්තානය, තායිලන්තය, ඉන්දියාව වැනි වැඩි වශයෙන් ආහාර ද්‍රව්‍ය අපනයනය කරන රටවල් අහිතකර කාලගුණයෙන් ෆ්‍රීඩ් පීඩාවට පත්ව ඇත. මෙයින් බලපෑමක් ඇතිවන්නේ ශ්‍රී ලංකාවටය. මෙරට නිපැයුම් සියයට විස්සකින් පමණ අඩු වී ඇති අතර ජගත් ප්‍රජාවගෙන් ආනයනය කරන්නට ඇති අවස්ථා සීමාසහිත වීම මිළ වැඩිවීමට හේතුවක් වෙයි. ඛනිජ තෙල් මිළ ඉහළයාම ද ආහාර මිළ වැඩි වීමට සෘජු හා වක්‍ර අන්දමෙන් විශාල බලපෑමක් එල්ල කරයි.. තෙල් මිළ වැඩි වීම සමග ජගත් ප්‍රජාව විකල්ප බලශක්ති භාවිතයට හුරු වෙමින් සිටී. එතනෝල් ඉන්ධනයක් වශයෙන් භාවිතා කිරීම ආරම්භ වී ඇත. එතනෝල් නිපදවෙන්නේ ආහාරයට ගත හැකි උක් ගස් හා තිරිඟු වැනි ධාන්‍ය උපයෝගී කර ගනිමිනි. ලෝකයේ මනුෂ්‍ය ආහාරයට ගතහැකි දේ ඉන්ධන බවට පරිවර්ථනය කිරීම වේගවත් වන තරමට ලෝකයේ ආහාර හිඟය බලවත් වෙමින් තිබේ. ආහාර ද්‍රව්‍ය නිපදවන්නටත්, ප්‍රවාහනයටත් ඉන්ධන අවශ්‍ය වන අතර ඒ නිසා ද ආහාර මිළ ගණන් වැඩි වෙයි. මෙය වර්තමානයේ අප මුහුණ පා ඇති බරපතල තත්ත්වයයි.

ආහාර මිළ වැඩිවන තරමට ඒවා පරිභෝජනය කරන මහජනතාවගේ ආදායම සීඝ්‍ර අන්දමින් වැඩි වන්නේ නැත. වෙළඳසැල්වල ඇති ආහාර දෙස බලමින් ඒවා මිළදී ගැනීමට ශක්තියක් නැති ජනතාවක් සිටීම සංවර්ධනය වන රටක අවාසනාවන්ත තත්ත්වයකි. මේ හෙයින් මිළදී ගැනීමට ආර්ථික ශක්තිය අහිමිවන මහජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම, ඔවුන්ට අවශ්‍ය තරමට ආහාර සැපයීම ආණ්ඩුවක වගකීමකි. ශ්‍රී ලංකාවේ ආහාර හිඟයක් ඇතිවිය හැකියැයි අනවශ්‍ය භීතියක් ඇති කර ගත යුතු නැත. නමුත් ආහාර මිළ වැඩි වීම සාමාන්‍ය ජනතාවට මිළදී ගැනීමට ඇති හැකියාව පහළ වැටෙන්නට ඉඩ තිබේ. ඒ නිසා සමාජ ප්‍රශ්න වැඩි වනු ඇත. ගැබිනි හා කිරි දෙන මවුවරුන්, දරුවන් පෝෂණ දුර්වලතා වලට ලක්විය හැකිය. කිරි වීදුරුවක් මාලු කෑල්ලක් ආහාර වේලට මිළදී ගත නොහැකි දරු පවුල් රට තුළ වැඩි වීම අනාගතයේ බිහිවන පරපුරේ දුර්වලතා වලට හේතු විය හැකිය. සාගතයෙන් මිනිසුක් මිය යා නොහැකි නමුත් ජීවත්වීමට සරිලන ආහාර පමණක් ලැබීම සංවර්ධනය නොවේ.

මෙවැනි පසුබිමක් තුළ මෙරට ආහාර ලබා ගැනීමේ අයිතිය, මහජනතාවට සමබර ආහාර වේලක් ලබා ගැනීමට පහසුකම් සැපයීම රටක වගකීමකි. අනාගතයේ එළැඹිය හැකි ගැටලු වලට කල්තබා විසඳුම් යෝජනා කර සූදානම් වීම දූරදර්ශී රජයක යුතුකමකි. මේ අවස්ථාවේ දී රජය ආහාර භෝග වගා කිරීම ගැන විශේෂ අවධානය යොමු කරයි. ගෙවතු මට්ටමින් නිෂ්පාදන නැංවීමට දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. එය ඉතා කාලෝචිතය.

ඒ අතරම රටේ ජනතාවට ආහාර ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කළ යුතුය. එය කළ හැක්කේ රජයේ ඒ වෙනුවෙන් මෙතෙක් ක්‍රියාත්මක කළ සහන වැඩ පිළිවෙළ සම්පූර්ණ ප්‍රතිසංවිධානයකට ලක් කිරීමකින් පමණකි.

ශ්‍රී ලංකාව යටත් විජිත බවින් නිදහස ලැබුවේ අදට වඩා වෙනස් ආර්ථික පරිසරයකය. රබර් මිළ ඉහළ මට්ටමක තිබිණි. දෙවන ලෝක යුද්ධය සමග ඇතිවූ මේ මිළ මෙරටට හොඳ ආර්ථිකයකට පදනමක් ඇති කළේය. මිනිරන් කුරුඳු වැනි අපනයන ද්‍රව්‍ය වලින් ද ලැබුණ ඉහල ආදායම නිසා  මෙරට ආදායම පැවතියේ ඉතාම හොඳ තත්ත්වයකය.

නිදහස ලබන විට රට තුළ සෑහෙන ධනයක් ඉතිරිව තිබුණ අතර අධිරාජ්‍යවාදීන්ගෙන් පාලනය බාරගත් මෙරට ප්‍රභූ පෙලැන්තිය මෙම මුදල් සමාජය ගොඩ නගන්නට යෙදවීය. ඒ අතරවාරයේ නැවත ධනය ඉපැයිය යුතුය.නමුත් ඒ අවස්ථාව උදා කරගන්නේ කෙසේද යන ප්‍රශ්නය ගැන පාලකයන් අවධානය යොමු කළේ නැත. එසේ ම සමාජය තමුන්ගේ වගකීම් සම්පූර්ණයෙන්ම පාලකයන්ට පවරා සියල්ල ආණ්ඩුවෙන් කරදෙන තෙක් බලා සිටියේය.

රජයේ ආදායම ආයෝජනයට යොදවනවා වෙනුවට පැවති ආණ්ඩු මෙම ආදායම සම්පූර්ණයෙන් වැය කළේ සමාජයේ නඩත්තුවටය. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාව, ආණ්ඩුවෙන් සහන යනාදී වශයෙන් හැම දෙයකටම රජය මැදිහත් විය. මහජනතාව මේවා ඉල්ලා සිටි සහන නොවේ.

එවැනි ආකල්ප අදහස් සමාජයේ  තහවුරු වුයේ දේශපාලනය විසින් මේ දුර්වල තැන් දේශපාලන බලය තහවුරු කර ගැනීම උදෙසා තම වාසියට ගැනීමත් සමගය. සහල්, පාන්, ධාන්‍ය රාත්තල්, සමෘද්ධි හා ජනසවිය වැනි කාරණා දේශපාලන වේදිකාවට පැමිණ මහජනතාවට සහන දීම ආණ්ඩුව කළ යුතු දෙයක් බවට තීන්දු කළේ දේශපාලන පක්ෂ තරගයට දේශපාලන පොරොන්දු දීම සමගය.
ආණ්ඩුව විසින් ජනතාව ගේ සියලු අවශ්‍යතා ඉටු කළ යුතුය යන සංකල්පය යටත් විජිත ලක්ෂණ වලින් ඉතිරි වූ එකකි. ඉතිහාසය පුරා ආණ්ඩු විසින් එකී අන්ධ සංකල්පය ඉදිරියට ගෙන ගියේය. එය පාලකයන් වශයෙන් දිගින් දිගටම බලය ආරක්ෂා කරගන්නට එය වාසියකි. නමුත් ආණ්ඩුවත් කළ යුත්තේ තම වැසියන්ට යමක් දී යැපෙන මානසිකත්වයෙන් තබා ගැනීමද? මගේ අදහස නම් එය නොවේ. ආණ්ඩුව කළ යුතු මහජනතාව දිරිමත් කර දියුණුව කරා පෙළඹවීමයි. ඔවුන්ටම නිදහස්ව, අදීනව වෙසෙන්නට හැකි තත්ත්වයක් උදා කර ගැනීමට මග පෙන්වීමයි.

අද පවතින මේ සමාජ රාමුවෙන් මිදෙන්නට බරපතල විප්ලවයක් සිදුවිය යුතුය. එය ආකල්ප වෙනසකි. දශක හයක් මේ රටේ මහජනතාව මේ වෙනස අපේක්ෂා කරන්නට ඇත. එනමුත් දේශපාලනඥයන් එයට ඉඩ දෙන්නේ නැත. ඡන්දයක් එන විට සියලුම දේශපාලන පක්ෂ පොරොන්දු සමග ඉදිරියට පැමිණෙයි. මේ දේශපාලන පොරොන්දු වැඩි ප්‍රමාණයක් ඉටු කල හැකි ඒවා නොවේ. මහජනතාව එය දනිති. ෆ්‍රින ෆ්‍රිනත් ඡන්දය දෙන්නේ විකල්පයක් නැති හෙයින් විය හැකිය. සුළු ප්‍රතිශතයක් මේ පොරොන්දු විශ්වාස කරනවා විය හැකිය. එකී සීමිත ප්‍රතිශතය ඡන්ද ප්‍රතිඵලයට බලපාන තීරණාත්මක එකකි.

මිනිසුන් ජීවත් කිරීම අරමුණ කරගෙන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සහනාධාර වැඩ සටහන් කොතරම්ද? දිළිඳු සහන, ජනසවිය, සමෘද්ධිය වැනි සංකල්ප ක්‍රියාත්මක විය. මේ සංකල්ප සමග ඇතිකරන ලද ප්‍රජා ක්‍රියාකාරකම් මගින් දිළිඳු ජනතාවගෙන් යම් කොටසක් දුගී භාවයෙන් අත් මිදෙන්නට ඇත. එනමුත් මේ වැඩසටහන් වෙනුවෙන් ඇති කරන ලද ආයතන, නිලධාරී යාන්ත්‍රණ තවමත් රජයට බරකි. දිළිඳු ජනතාව අතට පත් කරන ආධාර වලට වඩා වැඩි මුදලක් මෙම ආයතන නඩත්තුවට වැය කෙරෙයි. මෙම ආයතන වලට අමතරව පළාත් පාලන ආයතන මගින් ද, සමාජ සේවා අමාත්‍යංශය මගින් ද දුගී දුප්පත් ජනතාවට ආධාර සපයයි.

සෞඛ්‍ය සේවාවට රජය වියදම් කරන මුදල අති විශාලය. නොමිලේ අධ්‍යපානය, පාසල් නිල ඇඳුම්, පාසල් පෙළ පොත් හා පාසල් දරුවන්ගේ දිවා ආහාරය වෙනුවෙන් වාර්ෂිකව වැය කරන ධනස්කන්ධය විශාලය. වැඩි මිළට තෙල් ආනයනය කර අඩු මිළට සපයයි. වැඩි මුදලක් ගෙවා විදුලිය නිපදාවා පාඩු පිට බෙදා හරියි. බස්, දුම්රිය සේවා අකාර්යක්ෂමය. ඒ සේවාවලදී  මහජනතාව ගෙවන්නේ නියම මිළ නොවේ. මහජනතාවට බරක් වන නිසා අඩු සහන ගාස්තු ක(මයක්පවත්වාගෙන යයි. පානීය ජලය සැපයීම අඩු මිළටය. ගොවීන්ට ජල සම්පාදනය හා නොමිලේ දෙන තරමට සහන මිළකට පොහොර සපයයි. නිෂ්පාදන අළෙවිකරගත නොහැකි අවස්ථා වලදී වැඩි මිළක් ගෙවා රජය මිළදී ගන්නා අතර බැංකු ණය

නොගෙවන අවස්ථාවේ දී ඒවා කපා හරියි. මේ සියල්ල වැරදි නැත. අවශ්‍යයෙන් විය යුතු දේය. එනමුත් මේ සියලු සහන සපයන්නේ කාහටද? ඒවා ලැබිය යුත්තන්ටද?

කොළඹ නගරයේ ඇති පාසල් වල දරුවන්ට සපයන පෙළ පොත් වෙනුවෙන් මුදල් ගෙවන්නට ධනය ඇති දෙමවුපියන් ට අපහසුවක් නැත. ඔවුන් නිළ ඇඳුම් අවශ්‍ය නැති බව ප්‍රකාශ කරනු ඇත. රක්ෂණ පහසුකම් ඇති කළහොත් සෞඛ්‍ය සේවාවේ වැඩි පහසුකම් ලබාගන්නට සමාජයේ සෑම ජන කොටසකටම ලැබේ. රෝගියාට බරක් නොවී රක්ෂණය මගින් ගාස්තු අයකරන ක්‍රමයක් රජයේ රෝහල් වල ඇති කළ නොහැකිද? මේ සියල්ල කළ යුතු වන්නේ ඇයි? එවැනි ප්‍රතිසංස්කරණයක් හරහා මහජනතාවට විශාල සහන ලබා දිය හැකිය. මේ සහන ආණ්ඩුවේ වියදමින් යැයි බරපතල මිත්‍යාවක් මහජනතාව විශ්වාස කරයි. ආන්ඩුව සහන දෙන්නේ මහජනතාවගෙන් අයකරන බදු වලින්ය. රජයේ බදු ආදායම ප්‍රමාණවත් නොවන විට දේශීය හා විදේශීය වශයෙන් ණය ගනී. මේ ණය ගෙවන්නට අවුරුද්දක් පාසා රටට කරන්නට සිදුව ඇති වියදම විශාලය.

මේ සියලු සහන වෙනුවට නියම වශයෙන් සහන අවශ්‍ය ජන කොටස තෝරා ඔවුන්ට කෙලින්ම ආහාර ලබා ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කළ හැකිය. එවිට බදු ගෙවන ජනතාවට පවා දුප්පතුන්ට දෙන මිළට විදුලිය සපයන්නට සිදුවන්නේ නැත. අනෙක් අතට නොමිලේ අධ්‍යාපනය හා නොමිලේ සෞඛ්‍ය පහසුකම් යනුවෙන් කියන නමුත් එහි මහජනතාව දරන සත්‍ය වියදම අප මුලා කර තිබේ. අධ්‍යාපනය නොමිලේ නමුත් අතිරේක අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන් වියම් කරන මුදල සුළු එකක් නොවේ. අතිරේක පොත පත, පාසලේ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් විශාල වියදමක් දරයි. සෞඛ්‍ය වියදම ද එසේය. මේවා නියම අන්දමින් කළමණාකරණය කර හැකි අයට මුදල් ගෙවීම හා නොහැකි අයට හොඳ අධ්‍යාපනයක්, හොඳ සෞඛ්‍ය පහසුකම් සහන ලැබෙන ක්‍රමයක් අප යෝජනා කළ යුතුය.

සමෘද්ධි වැඩපිළිවෙල අගයකළ යුතු වුවත් හොඳට ආදායමක් ඇති කොපමණ පිරිසක් වැරදි තොරතුරු ඉදිරිපත්කර ඒවාට හිමිකම්කියත් ද? ආණ්ඩුවෙන් දෙන නිසා ගන්නා නමුත් මේ සමෘද්ධි සහන දෙන්නට රජය මුදල් උපයා ගන්නේ මහජනතාවට බදු පටවා බව තේරුම් ගත යුතුය. රුපියල් දෙසීයක ආහාර සලාකයක් නොමිලේ දෙන්නට තවත් තැනෙකින් රුපියල් තුන් හාරසියයක් උපයා ගන්නට රජයට සිදුවෙයි. එයට හේතුව නිලධාරීන්ගේ වැටුප් හා නාස්තිය දූෂණය එකතුවීම සමගය. ඕනෑම රටක සලාක, බලපත්‍ර හා රජයේ අවසර පත් නිකුත් කරන අවස්ථාවේ දී අතරමැදියන් නිසා දූෂණ සිදුවෙයි. වැළැක්විය නොහැකිය. සහනාධාර සපයන බව කියමින් අප පවත්වාගෙන යන්නේ මේ දූෂිත යාන්ත්‍රණයයි. එයට වන්දි ගෙවන්නේ පාලකයන් නොවේ. මහජනතාවයි.

රොහලෙන් රෝගීන් පරීක්ෂාකර නොමිලේ බෙහෙත් පෙත්තක් දෙන බව ඇත්තකි. එහෙත් මේ බෙහෙත් ආණ්ඩුවේ රෝහලෙන් නිකුත් කරන බෙහෙත් පෙත්ත ට මිළක් තිබේ. සාමාන්‍ය පාමසියක මිළටවඩා පිරිවැයක් රජය ඒ වෙනුවෙන් දරා ඇත. නොමිලේ බෙහෙත් දීම නතර කළහොත් මහජනතාවට මුදල් ගෙවා බෙහෙත් ගන්නට සිදුවෙයි. එවිට රජයේ බෙහෙත් වියදම නතරවන නිසා මහජනතාවගෙන් සෞඛ්‍ය සේවාවට අය කරන බදු නතර කළ හැකිය. මෙවැනි විකල්ප යෝජනා මිහිරි නැත. නිදහස ලැබූ දා පටන් පැවති චක්‍රයට සමාජය හුරු වී තිබේ. එය වෙනස් කරන්නට කතා කළොත් අපරාධකරුවෙකි. රටට ආදරය නොකරන්නෙකි. දේශපාලනඥයෙකු නම් මීළඟ මැතිවරණයේ දී පරාජයට පත්වන තැනැත්තෙකි. නමුත් අපට අලුත්න් සිතන්නට සිදුව තිබේ. ආණ්ඩුවට ආහාර, ගමනාගමන, සෞඛ්‍ය, අධ්‍යාපන, නිවාස ඇතුළු මහජනතාවට අවශ්‍ය සෑම දෙයක් ම නොමිලේ දිය හැකිය. ලෝක වෙළඳ පොළේ ඛනිජ තෙල් මිළ වැඩි වන විට එයටත් සහන දිය හැකිය. මේ වෙනුවෙන් මුදල් කොතැනින්ද? එය කළ නොහැකිවන දිනයක් ළඟාවනු ඇත. දුර දක්නා නුවණකින් යුතු පාලකයෝ මේ වෙනුවෙන් විකල්ප වැඩ පිලිවෙළ යෝජනා කරති. ඒවා ජනප්‍රිය නැත. එවැනි යෝජනා ඉදිරියේ කර්කෂ විවේචන වලට මුහුණ දෙන්නට සිදුවෙයි. නමුත් මේ පවතින රටාව ආපසු හැරෙන බව ෆ්‍රිනෙන විට මහජනතාව නායකයන්ට ගරු කරනු ඇත. තමන්ගේ දරුවන්ට අනාගතයක් ඇති බව වීත්තු යන විට ඔවුහු තව තවත් ප්‍රශංසා කරනු ඇත. නිවැරදි නායකත්වයවිය යුතු

මහජනතාව නලවා, සනහා ඔවුන්ගේ තාවකාලික වීරයන්වීම නොවේ. ශ්‍රී ලංකාවේ අතීතය දෙස ආපසු හැරී බලන විට මහජනතාව සනහා ඔවුන්ට අනුව රට පාලනය කළ පාලකයන් අද කිසිවෙකුට මතක නැත. මතකයට නැගෙන්නේ මහජනතාව වෙනුවෙන් විකල්ප වැඩ පිළිවෙල ඇතිකර ඔවුන් නගා සිටවී වීරයන් පමණකි.

එළැඹ ඇති ආහාර අර්බුදය හා එයට මුහුණ දෙන වැඩ පිළිවෙළ සමග රටට අලුත් දර්ශනයක් උදා කළ යුතුය. දේශපානයෙන් තොර ජාතික නායකයින් ගම් දනව් වලින් රුස්කර ඔවුන්ට යෝජනා ගෙන එන්නටත්, ඒ ගැන ජාතික සංවාද ඇති කරන්නටත් අවස්ථාව දිය යුතුය. ගමේ නායකයින්, ආගමික නායකයින් සහ පහළම තලයේ පරිපාලනය එකට එකතු වී තම ප්‍රදේශයේ සහන අවශ්‍ය දුගී දුප්පත් ජනතාව හඳුනාගත යුතුය. දිය යුතු පුද්ගලයාට වැඩිපුර දී ඔවුන් දුප්පත්කමින් මුදවන්නටත් සහන හිමි විය යුතු නැති පිරිසට කරුණාවෙන් තේරුම් කර දෙන්නටත් හැකි පෞර්ෂයකින් යුතු ජන මණ්ඩල ගම් මට්ටමින් ඇතිකළ යුතුය. එම තීරණ ක්‍රියාත්මක කළ හැකිය. එවිට ආහාර සුරක්ෂිතතාවය ගැනත්, මහජනතාවට ආහාර ලැබෙන බවට අයිතියකුත් සමාජයෙන් ම තහවුරුවෙයි. නීති පනවා බලහත්කාරයෙන් කරන ප්‍රතිසංස්කරණ වලට වඩා අද රටට අවශ්‍ය එවැනි පුරෝගාමී ව්‍යාපාරයකි.